ශ්‍රී බුද්ධ වර්ෂ 2556 – 2557

රාජ්‍ය වර්ෂ 2013



# බුදු සරණ

### දෙලොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**දුරුතු පසළොස්වක පොහොය**

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදුවූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්වන් සදහම් මගට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළිදිව බිම් තැන්නේ මහවැලි ගඟ අසබඩ මිනිපේ නම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදු රැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

**නවම් පසළොස්වක පොහොය**

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුණු පොහෝ දිනක ය.

**මැදින් පසළොස්වක පොහොය**

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදක ය.

**බක් පසළොස්වක පොහොය**

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින තෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා තිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

**වෙසක් පසළොස්වක පොහොය**

තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනය යි.

**පොසොන් පසළොස්වක පොහොය**

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

## 2013 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **උඳුවප් මස පෝය :-** | | | | | | | | | | | | |
| ජන. 04 | සිකුරාදා | අ. භා. | 09.54 න් | අව අටවක ලබා | 05 | සෙන. | අ. භා. | 08.48 න් | ගෙවේ. | 05 | සෙන. | සිල් |
| ජන. 11 | සිකුරාදා | පූ. භා. | 04.37 න් | අමාවක ලබා | 12 | සෙන. | පූ. භා. | 01.16 න් | ගෙවේ. | 11 | සිකුරා. | සිල් |
| **දුරුතු මස පෝය :-** | | | | | | | | | | | | |
| ජන. 18 | සිකුරාදා | අ. භා. | 04.30 න් | පුර අටවක ලබා | 19 | සෙන. | අ. භා. | 06.20 න් | ගෙවේ. | 18 | සිකුරා. | සිල් |
| ජන. 26 | සෙන. | පූ. භා. | 08.47 න් | පුර පසළොස්වක ලබා | 27 | ඉරිදා | පූ. භා. | 10.07 න් | ගෙවේ. | 26 | සෙන. | සිල් |
| පෙබ 03 | ඉරිදා | පූ. භා. | 08.14 න් | අව අටවක ලබා | 04 | සඳුදා | පූ. භා. | 06.34 න් | ගෙවේ. | 03 | ඉරිදා | සිල් |
| පෙබ. 09 | සෙන. | අ. භා. | 03.23 න් | අමාවක ලබා | 10 | ඉරිදා | අ. භා. | 12.55 න් | ගෙවේ. | 09 | සෙන. | සිල් |
| **නවම් මස පෝය** | | | | | | | | | | | | |
| පෙබ. 17 | ඉරිදා | අ. භා. | 12.49 න් | පුර අටවක ලබා | 18 | සඳුදා | අ. භා. | 03.21 න් | ගෙවේ. | 17 | ඉරිදා | සිල් |
| පෙබ. 25 | සඳුදා | පූ. භා. | 01.59 න් | පුර පසළොස්වක ලබා | 26 | අඟහ. | පූ. භා. | 01.55 න් | ගෙවේ. | 25 | සඳුදා | සිල් |
| මාර්තු 04 | සඳුදා | අ. භා. | 04.23 න් | අව අටවක ලබා | 05 | අඟහ. | අ. භා. | 02.22 න් | ගෙවේ. | 04 | සඳුදා | සිල් |
| මාර්තු 11 | සඳුදා | පූ. භා. | 02.33 න් | අමාවක ලබා | 12 | අඟහ. | පූ. භා. | 01.24 න් | ගෙවේ. | 11 | සඳුදා | සිල් |
| **මැදින් මස පෝය** | | | | | | | | | | | | |
| මාර්තු 19 | අඟහ. | පූ. භා. | 09.40 න් | පුර අටවක ලබා | 20 | බදාදා | අ. භා. | 12.11 න් | ගෙවේ. | 19 | අඟහ. | සිල් |
| මාර්තු 26 | අඟහ | අ. භා. | 04.22 න් | පුර පසළොස්වක ලබා | 27 | බදාදා | අ. භා. | 02.55 න් | ගෙවේ. | 26 | අඟහ. | සිල් |
| අප්‍රේල් 02 | අඟහ. | අ. භා. | 11.23 න් | අව අටවක ලබා | 03 | බදාදා | අ. භා. | 09.09 න් | ගෙවේ. | 03 | බදාදා | සිල් |
| අප්‍රේල් 09 | අඟහ. | අ. භා. | 02.48 | අමාවක ලබා | 10 | බදාදා | අ. භා. | 03.10 න් | ගෙවේ. | 09 | අඟහ. | සිල් |
| **බක් මස පෝය** | | | | | | | | | | | | |
| අප්‍රේල් 18 | බ්‍රහස්. | පූ. භා. | 05.00 න් | පුර අටවක ලබා | 19 | සිකුරා. | පූ. භා. | 06.55 න් | ගෙවේ. | 18 | බ්‍රහස්. | සිල් |
| අප්‍රේල් 25 | බ්‍රහස්. | පූ.භා. | 04.04 න් | පුර පසළොස්වක ලබා | 26 | සිකුරා. | පූ. භා. | 01.26 න් | ගෙවේ. | 25 | බ්‍රහස්. | සිල් |
| මැයි 02 | බ්‍රහස්. | පූ. භා. | 05.40 න් | අව අටවක ලබා | 03 | සිකුරා. | පූ. භා. | 03.59 න් | ගෙවේ. | 02 | බ්‍රහස්. | සිල් |
| මැයි 09 | බ්‍රහස්. | පූ. භා. | 04.19 න් | අමාවක ලබා | 10 | සිකුරා. | පූ. භා. | 06.00 න් | ගෙවේ. | 09 | බ්‍රහස්. | සිල් |
| **වෙසක් මස පෝය:-** | | | | | | | | | | | | |
| මැයි 17 | සිකුරාදා | අ. භා. | 09.26 න් | පුර අටවක ලබා | 18 | සෙන. | අ. භා. | 10.27 න් | ගෙවේ. | 18 | සෙන. | සිල් |
| මැයි 24 | සිකුරාදා | අ. භා. | 01.20 න් | පුර පසළොස්වක ලබා | 25 | සෙන. | පූ. භා. | 09.55 න් | ගෙවේ. | 24. | සිකුරා. | සිල් |
| මැයි 31 | සිකුරාදා | අ. භා. | 01.08 න් | අව අටවක ලබා ජූනි | 01 | සෙන. | අ. භා. | 12.11 න් | ගෙවේ. | 31 | සිකුරා. | සිල් |
| ජූනි 07 | සිකුරාදා | අ. භා. | 07.04 න් | අමාවක ලබා | 08 | සෙන. | අ. භා. | 09.28 න් | ගෙවේ. | 08 | සෙන. | සිල් |
| **පොසොන් මස පෝය:-** | | | | | | | | | | | | |
| ජූනි 16 | ඉරිදා | පූ. භා. | 10.44 න් | පුර අටවක ලබා | 17 | සඳුදා | පූ. භා. | 10.47 න් | ගෙවේ. | 16 | ඉරිදා | සිල් |
| ජූනි 22 | සෙන. | අ. භා. | 08.53 න් | පුර පසළොස්වක ලබා | 23 | ඉරිදා | අ. භා. | 05.03 න් | ගෙවේ. | 23 | ඉරිදා | සිල් |
| ජූනි 29 | සෙන. | අ. භා. | 10.33 න් | අව අටවක ලබා | 30 | ඉරිදා | අ. භා. | 10.38 න් | ගෙවේ. | 30 | ඉරිදා | සිල් |
| ජූලි 07 | ඉරිදා | පූ. භා. | 10.20 න් | අමාවක ලබා | 08 | සඳුදා | අ. භා. | 12.44 න් | ගෙවේ. | 07 | ඉරිදා | සිල් |
| **ඇසළ මස පෝය :-** | | | | | | | | | | | | |
| ජූලි 15 | සඳුදා | අ. භා. | 09.05 න් | පුර අටවක ලබා | 16 | අඟහ. | අ. භා. | 08.15 න් | ගෙවේ. | 16 | අඟහ. | සිල් |
| ජූලි 22 | සඳුදා | පූ. භා. | 03.33 න් | පුර පසළොස්වක ලබා | එදිනම | | අ. භා. | 11.48 න් | ගෙවේ. | 22 | සඳුදා | සිල් |
| ජූලි 29 | සඳුදා | පූ. භා. | 10.47 න් | අව අටවක ලබා | 30 | අඟහ. | පූ. භා. | 11.59 න් | ගෙවේ. | 29 | සඳුදා | සිල් |
| අගෝ. 06 | අඟහ. | පූ. භා. | 01.33 න් | අමාවක ලබා | 07 | බදාදා | පූ. භා. | 03.21 න් | ගෙවේ. | 06 | අඟහ. | සිල් |
| **නිකිණි මස පෝය:-** | | | | | | | | | | | | |
| අගෝ. 14 | බදාදා | පූ. භා. | 05.10 න් | පුර අටවක ලබා | 15 | බ්‍රහස්. | පූ. භා. | 03.35 න් | ගෙවේ. | 14 | බදාදා | සිල් |
| අගෝ 20 | අඟහ. | පූ. භා. | 10.24 න් | පුර පසළොස්වක ලබා | 21 | බදාදා | පූ. භා. | 07.17 න් | ගෙවේ. | 20 | අඟහ. | සිල් |
| අගෝ 28 | බදාදා | පූ. භා. | 02.09 න් | අව අටවක ලබා | 29 | බ්‍රහස්. | පූ. භා. | 04.12 න් | ගෙවේ. | 28 | බදාදා | සිල් |
| සැප්. 04 | බදාදා | අ. භා. | 04.20 න් | අමාවක ලබා | 05 | බ්‍රහස්. | අ. භා. | 05.04 න් | ගෙවේ. | 04 | බදාදා | සිල් |
| **බිනර මස පෝය :-** | | | | | | | | | | | | |
| සැප්. 12 | බ්‍රහස්. | පූ. භා. | 11.37 න් | පුර අටවක ලබා සැප්. | 13 | සිකුරා. | පූ. භා. | 09.35 න් | ගෙවේ. | 12 | බ්‍රහස්. | සිල් |
| සැප්. 18 | බදාදා | අ. භා. | 06.44 න් | පුර පසළොස්වක ලබා | 19 | බ්‍රහස්. | අ. භා. | 04.48 න් | ගෙවේ. | 19 | බ්‍රහස්. | සිල් |
| සැප්. 26 | බ්‍රහස්. | අ. භා. | 08.15 න් | අව අටවක ලබා | 27 | සිකුරා. | අ. භා. | 10.41 න් | ගෙවේ. | 27 | සිකුරාදා | සිල් |
| ඔක්. 04 | සිකුරාදා | පූ. භා. | 06.38 න් | අමාවක ලබා | 05 | සෙන. | පූ. භා. | 06.05 න් | ගෙවේ. | 04 | සිකුරාදා | සිල් |
| **වප් මස පෝය:-** | | | | | | | | | | | | |
| ඔක්. 11 | සිකුරාදා | අ. භා. | 05.40 න් | පුර අටවක ලබා | 12 | සෙන. | අ. භා. | 03.28 න් | ගෙවේ. | 11 | සිකුරාදා | සිල් |
| ඔක්. 18 | සිකුරාදා | පූ. භා. | 05.35 න් | පුර පසළොස්වක ලබා | 19 | සෙන. | පූ. භා. | 05.09 න් | ගෙවේ. | 18 | සිකුරාදා | සිල් |
| ඔක්. 26 | සෙන. | අ. භා. | 03.59 න් | අව අටවක ලබා | 27 | ඉරිදා | අ. භා. | 06.17 න් | ගෙවේ. | 26 | සෙන. | සිල් |
| නොවැ. 02 | සෙන. | අ. භා. | 08.10 න් | අමාවක ලබා | 03 | ඉරිදා | අ. භා. | 06.17 න් | ගෙවේ. | 03 | ඉරිදා | සිල් |
| **ඉල් මස පෝය :-** | | | | | | | | | | | | |
| නොවැ 10 | ඉරිදා | පූ. භා. | 00.30 න් | පුර අටවක ලබා | එදිනම | | අ. භා. | 10.36 න් | ගෙවේ. | 10 | ඉරිදා | සිල් |
| නොවැ. 16 | සෙන. | අ. භා. | 07.47 න් | පුර පසළොස්වක ලබා | 17 | ඉරිදා | අ. භා. | 08.49 න් | ගෙවේ. | 17 | ඉරිදා | සිල් |
| නොවැ. 25 | සඳුදා | අ.භා. | 12.00 න් | අව අටවක ලබා | 26 | අඟහ. | අ.භා. | 01.43 න් | ගෙවේ | 25 | සඳුදා | සිල් |
| දෙසැ. 02 | සඳුදා | පූ.භා. | 08.54 න් | අමාවක ලබා | 03 | අඟහ. | පූ.භා. | 05.53 න් | ගෙවේ. | 02 | සඳුදා | සිල් |
| **උඳුවප් මස පෝය :-** | | | | | | | | | | | | |
| දෙසැ. 09 | සඳුදා | පූ.භා. | 09.26 | පුර අටවක ලබා | 10 | අඟහ. | පූ.භා. | 08.14 න් | ගෙවේ. | 09 | සඳුදා | සිල් |
| දෙසැ . 16 | සඳුදා | අ.භා. | 12.53 න් | පුර පසළොස්වක ලබා | 17 | අඟහ. | අ.භා. | 03.00 න් | ගෙවේ. | 16 | සඳුදා | සිල් |
| දෙසැ. 25 | බදාදා | පූ.භා. | 06.47 | න් අව අටවක ලබා | 26 | බ්‍රහස්. | පූ.භා. | 07.37 න් | ගෙවේ | 25 | බදාදා | සිල් |
| දෙසැ. 31 | අඟහ. | අ.භා. | 08.29 න් | අමාවක ආරම්භ වේ. | 2014.01.01 | | | | | | බදාදා | සිල් |

### දෙලොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**ඇසළ පසළොස්වක පොහොය.**

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝද.

**නිකිණි පසළොස්වක පොහොය**

ඇසළ අව පෑළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝද පොහොය කොට නිකිණි අව පෑළවිය ද පසු වස් එළඹීමයි සසුන් පිළිවෙත වන්නේ.

**බිනර පසළොස්වක පොහොය**

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණි සසුණේ ආරම්භය සිදු විය.

**වප් පසළොස්වක පොහොය**

වස්සාන ඍතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින්ද ව්‍යවහාර කැරේ.

**ඉල් පසළොස්වක පොහොය**

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණ ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසු වස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝදා ය.

**උඳුවප් පසළොස්වක පොහොය**

උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකා ගමනය ගැන ලංකා මෙහෙණි සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

වෂී 2013 ක්වූ ජනවාරි 05 වනදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.